Dialogue Decalogue by Leonard Swidler

අචාර්ය ලෙනාඩ් ස්විඩ්ලර් විසින් සම්පාදිත

# අන්තර්-ආගමික සංවාදයේ දසපණත

පරිවර්තනය: ආචාර්ය ඇන්ටනි ප්‍රනාන්දු

## විවිධ ආගම් අදහන්නන් අතර සුහද සාකච්ඡා නොහොත් සංවාද පවත්වන විට පිළිපැදිය යුතු ප්‍රාථමික නීති රීති

විවිධ ආගම්වලට හෝ සංස්කෘතිවලට අයත් අය අතර සම්මුඛ සාකච්ඡා මීට පෙර කවදාවත් දක්නට ලැබී නැත. පෙර කාලවලදී එවැනි සාකච්ඡා තිබිය හැකියයි කියා පිළිගැනුනේවත් නැත. එහෙත් දැන් ඒවා ඇතිවන්නට පටන් ගෙන ඇත. දැන් උදාවී ඇති ප්‍රශ්නය ඒවා එකිනෙකට වෙනස් පාර්ශව දෙකටම ඵලදායක ලෙස මෙහෙයවිය යුත්තේ කෙසේද යන්නය. මා මෙහි දක්වා ඇත්තේ දෙපාර්ශවයේම අයට එක හා සමාන ඵල ලැබෙන්නට නම්ල එම සාකච්ඡා පවත්වන විට පිළිපැදිය යුතු ප්‍රතිපත්ති නොහොත් නීති රීතිය. ඒ ප්‍රතිපත්තිවලට බයිබලයේ එන "දස පණත්" යන වචනයම මම යොදා ඇත. එහෙත් බයිබලයේ දසපණත මෙන් මේවා එලොවින් ආ ප්‍රතිපත්ති මාලාවක් නොවේ. ප්‍රායෝගික අවශ්‍යතා මත අත්හදා බැලීමෙන්ම අවබෝධ කර ගත් ඒවාය.

**පළමු පණත**

සංවාදයේ ප්‍රධාන අරමුණ ඉගෙනීමය. වෙනත් විධියකින් කියතොත් ආගම ගැන වෙනත් ආගමක් අදහන්නෙකුගේ අදහස් සැලකිල්ලට ගෙන ආගමේ යථාර්ථය පිළිබඳව තමන් තුළ ඇති අවබෝධය වර්ධනය කර ගැනීමය. අනිකාගේ ආගම ගැන අවබෝධයක් මට ලැබුණු විට අනිකා ගැනමද මගේ ආකල්පය වෙනස්වෙනු නියතය. කෙනෙක් සංවාදයේ යෙදෙන්නේ අනිකාගේ අදහස් වෙනස් කිරීමේ අදහසින් නොවේ. ආගමික චින්තනය අතින් තමා තුළම වැඩිදියුණුවක් ඇතිකරගැනීමටය. සංවාදය යන්න වාද විවාද තරඟයකට වඩා වෙනස් වෙන්නේ එතැනය. වාද තරඟවල කෙරෙන්නේ අනිකාගේ මත වැරදි බව පුළුවන් තරම් උපක්‍රමශීලීව ඔප්පුකර ඔහුව පැරදවීම යග සංවාදයකදී දෙදෙනාම බලාපොරොත්තු වෙන්නේ තමන් නොදන සිටි යමක් අනිකාගෙන් ඉගෙනීමට ය. සංවාදයක් සාර්ථක වෙන්නේ ඊට සහභාගිවන දෙදෙනාටම එයින් හොඳක් වෙනවානම් පමණි.

**දෙවන පණිත**

අන්තර් ආගමික හෝ අන්තර් සංස්කෘතික සංවාදයක් ද්විපාර්ශික ව්‍යාපෘතියක් විය යුතුය. සාකච්ඡාව එකම ආගමකට අයත් පිරිස් දෙකක් අතර හෝ එකිනෙකට වෙනස් ආගම් දෙකකට අයත් පිරිස් දෙකක් අතර විය හැක. උදාහරණයක් වශයෙන් ලූතරානු ක්‍රිස්තු භක්තිකයින්ට ඔවුන්ගේම කාණ්ඩ දෙකක් අතර සංවාදය මෙහෙයවිය හැක. නැත්නම් ලූතරානු පිරිසකට වෙනම ක්‍රිස්තියානි නිකායක්වන අංග්ලිකානු පිරිසක් සමග එය මෙහෙයවිය හැක. දෙකේම අරමුණ ආගමේ යථාර්ථය ගැන වඩා ගැඹුරු අවබෝධයක් ලබාගෙන ආගම හා සංස්කෘතිය ගැන තමා මෙතෙක් දැරූ ආකල්පය වඩා තාත්වික කරගැනීමය. හරියාකාර කරනු ලැබුවහොත් ඒ ආකල්පික වෙනස සංවාදයට සහභාගිවන හැමෝම තුළ ඇතිවන්නේ ය.

**තුන්වෙනි පණිත**

සංවාදයට හැම කෙනෙක්ම පැමිණිය යුත්තේ අංගසම්පූර්ණ අවංකභාවයකින් හා විවෘතත්වයකින් යුතුවය. දෙපාර්ශවයේම අය තමන් අදහන ආගමේ ප්‍රධාන හා අතුරු අරමුණුද එය තුළ අළුතින් ඇතිවේගෙන එන වෙනස්කම්ද තමා අදහන ආගම ගැන තමන්ට ගැටළු ඇත්නම් ඒවාද මොච්හු නිරවුල්ව ඉදිරිපත් කළ යුතුය. ඒවා සම්බන්ධයෙන් හිතට එකඟව කථාකළ යුතුය. බොරු මුහුණුවරක් නොදැක්විය යුතුය.

ප්‍රතිවිරුද්ධ පැත්තේ අනිකා තුළද එවැනිම අවංකභාවයක් හා විවෘතත්වයක් ඇතැයි විශ්වාස කළ යුතුය. අන්‍යෝන්‍ය විශ්වාසයක් නැති තැන සත්‍ය සංවාදයක් තිබිය නොහැක. විශ්වාසනීයත්වයක් නැත්නම් ඕනෑම සංවාදයක් ඉබේම බිම වැටේ.

**හතරවෙනි පණිත**

අන්තර් ආගමික හෝ අන්තර් සංස්කෘතික සංවාදයකදී එක පාර්ශවයක ආගමික ධර්මසිද්ධාන්ත අනිත් පාර්ශවයේ චාරිත්‍ර වාරිත්‍ර හා සැසඳිය නොයුතුය. අපේ ධර්ම සිද්ධාන්ත සැසඳිය යුත්තේ අනිකාගේ ධර්ම සිද්ධාන්ත සමගය. අපේ චාරිත්‍ර වාරිත්‍ර අනිකාගේ චාරිත්‍ර වාරිත්‍ර සමගය. උදාහරණයක් දක්වතොත් වැන්දඹුවන් සප්‍රාණිකව පිළිස්සීමේ හින්දු චාරිත්‍රය සසැඳිය යුත්තේ මිථ්‍යාදෘෂ්ඨිකයින් හෝ අනවින කාරයන් පිළිස්සීමේ ක්‍රිස්තියානි චාරිත්‍රය සමගය.

**පස්වෙනි පණිත**

සංවාදයේ යෙදෙන හැම කෙනෙකුටම තමා කව්ද කියා අනිකාට නිරවුල්ව පහදා දීමට හැකිවිය යුතුය. එසේ වන්නේ ඕනෑම ආගමක් ගැන හරියාකාරව පැහැදිලි කළ හැක්කේ එය අදහන්නෙකුට පමණක් වන නිසාය. උදාහරණයක් වශයෙන් යුදෙව්වෙකු වෙන්නේ කවරෙක්ද කියා පැහැදිලි කළ හැක්කේ යුදෙව්වෙකුට පමණය. අනිකාට දක්විය හැක්කේ යුදෙව්වා පිටතින් පෙනෙන විලාශය පමණය. නමුත් සංවාදයට අයත් මනස හැඩගැසීමේ බලය නිසාල අනිකාගේ විස්තරවලට ඇහුම්කන් දීමේ ප්‍රතිඵලයක් වශයෙන් තමා ගැන තමා සිතන දේද වෙනස් වෙන්නට පුළුවන. සංවාදයෙන් පසු තවත් යුදෙව්වන් සමග කථාකරන විට ඒ බව යුදෙව්වෙකුට වැටහෙනු ඇත.

එක ආගමක් අදහන ඕනෑම කෙනෙකුට ඔහු ගැන අනිකා කරන විග්‍රහය අගය කරන්නටද පුළුවන් විය යුතුය. අන්තර් ආගමික සංවාදයේ පුරෝගාමියෙකු සේ සැලකෙන රයිමොන්ඩා පනික්කාර් නැමති තැනැත්තා එය ආගමක දියුණුවට අත්‍යවශ්‍යයයි කියාද පවසා ඇත. එහෙත් එසේ වීමට එක ආගමිකයෙකු ගැන අනිකා කරන විග්‍රහය හැකිතාක් දුරට තාත්වික විය යුතුයැයි කියා විල්ප්‍රඩ් කැන්ට්වල් ස්මිත් නැමැත්තා "ලෝක ආගමික දර්ශණයක්, යන පොතේ ප්‍රකාශ කර ඇත.

**හයවෙනි පණත**

"අනිකාගේ අර අදහස හෝ මේ අදහස සමග මට එකඟවිය නොහැකිය, යැයි කලින් තීරණය කරගෙන කිසිවෙක් සංවාදයට පිවිසිය නොයුතුය. සංවාදයකදී දෙපාර්ශයවම ප්‍රථමයෙන් කළ යුත්තේ අනිකාගේ අදහස්වලට සාමකාමීවද සන්සුන්වද ඇහුම්කන් දීමය. "මගේ ආගමේ ධර්මතාවලට පිටුනොපා පිළිගන්නට පුළුවන් හැමදෙයක්ම පිළිගැනීමට මම සූදානම්, යන හැඟීමෙන්ම එසේ කළ යුතුය. එහෙත් අනිකාගේ අදහසක් තම හෘදසාක්ෂියට එකඟව පිළිගත නොහැකියැයි හැඟේනම් ඒබව ප්‍රකාශ කිරීමට මැලි නොවිය යුතුය. නමුත් එතැන එකඟත්වයට නොපැමිණීම සංවාදයට පෙර තීරණය කරගෙන හිටිය නොඑකඟත්වයට වඩා වෙනස් බව කාටවුවද පෙනී යා යුතුය.

**හත්වෙනි පණත**

සංවාදයක් ඇතිවිය හැක්කේ ඉගෙනීමට තියෙන ඕනෑකම අතින් එක හා සමාන මට්ටමක ඉන්න දෙපාර්ශවයක් අතර පමණි. "අපි ඔවුන්ට වඩා උසස්, ඔවුන් අපට වඩා පහත්, යැයි සිතාගන්නා දෙපාර්ශවයක් අතර සංවාදයක් ඇතිවිය නොහැක. 1962-65 වසරවල වතිකානුවේ පැවැත්වුන දෙවන මහා සම්මන්ත්‍රණයේදී ඒ බව පැහැදිලිව ප්‍රකාශ විය. දෙපාර්ශවයම සංවාදයට පැමිණිය යුත්තේ අනිත් පාර්ශවයෙන් අළුතින් යමක් ඉගෙන ගත හැකි යැයි යන විශ්වාසය ඇතිවය. හින්දු ආගම තම ආගමට වඩා පහත්යැයි කියාගන්නා මුස්ලිම් බැතිමතෙක් හා මුස්ලිම් ආගම තම ආගමට වඩා පහත් යැයි කියාගන්නා හින්දු බැතිමතෙක් අතර සංවාදයක් තිබිය නොහැක. මුස්ලිම් හා හින්දු යන බැතිමතුන් දෙදෙනාම ඉගෙනීමේ අවශ්‍යතාව අතින් එකම මට්ටමේ යැයි යන නිහතමාන හැඟීම ඇතිව සාකච්ඡාවේ යෙදිය යුතුය. එයින් ප්‍රකාශ වෙන්නේ සංවාදය යන්න ඒක පාර්ශ්වික ව්‍යායාමයක් නොවන බව ය. උදාහරණයක් වශයෙන් 1960 ගණන්වල කෙරුණු යුදෙව්-ක්‍රිස්තියානි ආරම්භක සංවාදවලදී යුදෙව් භක්තිකයින්ට ඕනෑවී තිබුණේ ක්‍රිස්තුභක්තිකයින්ට ඔවුන්ගේ අඩුපාඩුකම් පෙන්වාදීම පමණි. ඒ සංවාද අසාර්ථක විය. ඒවා සාර්ථක වීමට නම් යුදෙව් ක්‍රිස්තියානි දෙපාර්ශවයේම අය ඉගෙනීමේ ආශාව අතින් එකම මට්ටමේ යැයි කියා සිතාගෙන සංවාදයට එළඹිය යුතුය.

**අටවෙනි පණත**

එකිනෙකට වෙනස් ආගම් දෙකක් හෝ දර්ශණ දෙකක් පිළිපදින දෙදෙනෙකු අතර සුහද සංවාදයක් ඇතිවිය හැක්කේ දෙදෙනා අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් හා පිළිගැනීමක් මුල සිට ගොඩනගාගැනීමට හැකිවුවහොත් පමණි. එවැනි අන්‍යෝන්‍ය පිළිගැනීමක් ගොඩනගාගැනීමට නම් දර්ශණ දෙකෙන් දෙදෙනාටම පිළිගත හැකි පොදු මූලික කරුණු වෙත පමණක් මුලින් අවධානය යොමුකළ යුතුය. උදාහරණයක් වශයෙන් සංවාදය කෙරෙන්නේ මාක්ස්වාදියෙක් හා මාඕවාදියෙක් වැනි දෙදෙනෙකු අතර නම්,

මාක්ස්වාදයට හා මාඕවාදයට පොදු යැයි කිව හැකි මූලික කරුණු සොයාගෙන ඒවා ගැන මුලින් සාකච්ඡා කළ යුතුය. එසේම ඒවා ගැන කථා කළ යුත්තේ තමන්ගේ පෞද්ගලික පෞරුෂත්වය රැකෙන විලාශයකටය. ඊට හේතුව සුහද සංවාදයක් ඇතිවිය හැක්කේ එකිනෙකාට ගරුකරන පුද්ගලයන් දෙදෙනෙකු අතර මිස දර්ශන දෙකක් අතර නොවන නිසාය. අන්‍යෝන්‍ය විශ්වාසයක් හා පිළිගැනීමක් ඇතිවූවාට පසු එකඟ විය නොහැකි වෙනත් කරුණු සාකච්ඡාවට ගත හැකිය. වසර ගණනාවක් තුළ එදිරිවාදිකම් තිබී ඇති දර්ශන දෙකක් පිළිගන්නා දෙදෙනෙකු අතර එකවිටම අත්වැල්-බැඳගැනීමක් ඇතිවිය නොහැක. නමුත් පොදු කරුණුවලින් පොදු නොවන කරුණු වෙත ක්‍රම ක්‍රමයෙන් පිවිසෙනවානම් දෙදෙනා අතර පිළිගැනීම පළුදුකරගන්නේ නැතුව දර්ශන දෙකේ වෙනස්කම්වලට ගරුකිරීමට දෙදෙනාට හැකිවෙනු ඇත.

**නවවෙනි පණත**

අන්තර් ආගමික සංවාදයකට ඇතුළුවෙන කවරෙක් වුවද තමන් අදහන ආගමේ අඩුපාඩුකම් ඇත්නම් ඒවා අවංකව පිළිගැනීමට සැරසී සිටින්නෙකු විය යුතුය. තමා අදහන ආගමේ හෝ පිළිපදින දර්ශනයේ කිසිම අඩුපාඩුවක් නැතැයි කියා තරයේ විශ්වාස කරන පුද්ගලයා ආගම් සංවාදයේ යෙදීමෙන් ඵලක් ලබන්නේ නැත. සංවාදයකින් වැඩක් වෙන්නේ තම ආගමික චර්යාවේ අඩුපාඩුකම් ඇත්නම් ඒවා පරික්ෂාකර බලා වැරදි තැන් හරි ගස්සා ගැනීමට කැමැත්තක් ඇත්තෙකුට පමණි. තමන්ගේ ආගම වුවද විවෘතත්වයකින් හා අවබෝධයකින් යුතුව ඇදහිය හැක්කේ අවශ්‍ය වූ විට තමන්වම දෝෂදර්ශනයට ලක්කල හැක්කෙකුට පමණි.

**දසවෙනි පණත**

අවංක හදවතකින් ආගමික සංවාදයේ යෙදෙන කවරෙක් වුවද අනිකාගේ ආගම හා ආගමික දර්ශනය තමා තුළද අත්හදා බැලීමට ප්‍රයත්න දැරිය යුතුව ඇත. ආගමික දර්ශනයක් තියෙන්නේ මොළෙන් තේරුම් ගැනීමට පමණක් නොවේ. ආගමක් කායික ක්‍රියාවලින් ප්‍රකාශකළ යුතුව ඇත. හදවතින් පිළිපැදිය යුතුය. ආධ්‍යාත්මයෙන් අත්දැකිය යුතුය. ජෝන් ඩන් නැමැති පඬිවරයා (සෑම පෘතුවියේ ගමන් මග, යන අර්ථය ඇති මාතෘකාවකින් යුත් පොතක) කියා ඇති පරිදි ආගමක් ගැඹුරින් හදාරන්නෙකුට තම ආගම අත්නොහැර තවත් ආගමකට මාරුවීමට පුළුවන් විය යුතුය. එය අනිවාර්යයෙන්ම කළ යුත්තක්ද වේ. එසේ කළ විට එම ආගමෙන් ලැබෙන අවබෝධයෙන් තම ආගම වඩා පුළුල්වද ගැඹුරටද ඇදහීමට හැකිවනු ඇත.

**පළඳුරීමේ පියවරවල් තුන :** පණත් දහයකට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු යැයි ඉහත කියැවුන අන්තර් ආගමික සංවාදය ප්‍රතිඵල ලබන්නේ පියවරවල් තුනකින් බවද මෙහිදී සඳහන් කළ යුතුය. එයින් පළමුවැන්න, එක් එක් ආගම් ගැන අප තුළ එතෙක් තිබුණ දුර්මත පහවී යැමය. ඒ සමගම ආගමේ පොදු යථාර්ථය ගැන අපේ නොදැනුම අපට හරිගස්සා ගැනීමට හැකිවීමය. දෙවෙනි පියවර, අනිකාගේ ආගමේ ශුභවාදී පැති වටහාගෙන ඒවා අපේ ආගමික චර්යාවට ඇතුළත් කර ගැනීමට ඉඩකඩ ලැබීමය. උදාහරණයක් වශයෙන් බෞද්ධ හා ක්‍රිස්තියානි යන ආගම් දෙක සැලකිල්ලට ගත හැක. ඒ දෙක අතර සංවාදයේදී බුද්ධාගමේ භාවනා සම්ප්‍රදාය ගැන පැහැදීමක්,

ක්‍රිස්තුභක්තිකයෙකුට ඇතිවේ නම් ක්‍රිස්තුභක්තිකයාට එය තම චර්යාවට ඇතුළත් කර ගත හැක. ක්‍රිස්තියානියේ සමාජ සාධාරණ දර්ශනය ගැන පැහැදීමක් බෞද්ධයාට ඇතිවේ නම් එය තම ජීවිත රටාවට ඇතුළත්කර ගැනීමට බෞද්ධයාට හැකිවෙනු ඇත. තුන්වෙනි පියවර ඇතිවිය හැක්කේ පළමු දෙක සාර්ථකව ඉටුවී ඇත්නම් පමණි. එයින් ජීවිතය හා මරණය යන සත්‍යතාවයේ යටිපැත්ත අපි දෙගොල්ලන්ටම අපි මෙතෙක් නුදුටු විලාශයකට පෙනී යනු ඇත. එයින් අපට අපේ ආගමත් ඔවුන්ට ඔවුන්ගේ ආගමත් වඩා ගැඹුරු අවබෝධයකින් හා අවංකභාවයකින් යුතුව පිළිපදින්නට පුළුවන් වෙනු ඇත.

27-12-2014